# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 379/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 03/03/2024 පැය 2300

## මාධ්‍ය නිවේදනය

**01. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකය.**

2024.03.03 වන දින උදෑසන කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 810 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

2024.03.03 වන දින දහවල් කාලයේදී බොරලැස්ගමුව පොලිස් වසමේ බෙල්ලන්විල ප්‍රදේශයේදී වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 04 මිලිග්‍රෑම් 260 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන බොරලැස්ගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන බොරලැස්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

යුක්තිය මෙහෙයුමත් සමඟ මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ පිරිස් අත්අඩංගුවට පත්වීම සහ සැඟව සිටීම හේතුවෙන් සුදු ක්‍රීඩාවේ යෙදී සිටි පිරිසක් මත්ද්‍රව්‍ය ජාවාරම් වලට යොමු වී ඇති බවට විමර්ශනයේදී නිරීක්ෂණය වී ඇත. ගල්කිස්ස හා බොරලැස්ගමුව පොලිස් ස්ථාන මගින් වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 02. ඇතෙකු ඝාතනය කර ඇත් දළ යුගල කපා ගෙන යාම සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.

2024.03.01 වන දින උදෑසන කාලයේ ඇතිමලේ පොලිස් වසමේ ඇතිමලේ රක්ෂිතයේ නරියාය ප්‍රදේශයේ ඇතෙකු ඝාතනය කර ඇත් දළ යුගල කපා ගෙන ගොස් ඇති බවට ඇතිමලේ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

සියඹලාණ්ඩුව පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් විසින් 2024.03.01 වන දින දහවල් කාලයේදී ඇතිමලේ රක්ෂිතයේ වැටලීම් සිදුකරමින් සිටියදී ඇතෙකුගෙන් කපන ලද ඇත් දළයක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත. එම සැකකරුගෙන් කරන ලද ප්‍රශ්න කිරීමේදී ඉහත ඝාතනය කරන ලද ඇතාගෙන් කපන ලද දකුණු දළය බවට අනාවරණය වී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන අම්බලන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු වැඩිදුර විමර්ශන සඳහා ඇතිමලේ වනජීවී කාර්යාලය වෙත භාර දී ඇත.

ඡායාරූපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරවමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**